ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංකය : PS/SP/Circular/07/2020
2020 පෙබරවාරි මස 07 වන දින

අග්‍රාමාත්‍ය ලේකම්
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
හා රාජ්‍ය අමාත්‍ය ලේකම්වරුන්

**<u>පෞද්ගලික කාර්යමණ්ඩල මගින් ලිපි නිකුත් කිරීම</u>**

ගරු අග්‍රාමාත්‍යතුමන්, ගරු අමාත්‍යවරුන් හා ගරු රාජ්‍ය අමාත්‍යවරුන්ගේ පෞද්ගලික ලේකම්වරු මහජන සම්බන්ධතා නිළධාරීන් හා අනෙකුත් කාර්ය මණ්ඩල නිළධාරීන් විසින් ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු අමාත්‍යවරුන් හා ගරු රාජ්‍ය අමාත්‍යවරුන් වෙනුවෙන් රාජ්‍ය කටයුතු, ව්‍යාපෘති හෝ වෙනත් මූල්‍ය ගණුදෙණු සඳහා ලිපි හෝ දුරකථන ඇමතුම් ලබා දීම වැලැක්වීම සඳහා වහාම කටයුතු කරන ලෙස අග්‍රාමාත්‍ය ලේකම්, අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්ට උපදෙස් දෙන ලෙස අතිගරු ජනාධිපතිතුමන් විසින් නියෝග කර ඇත.

තවද, ගරු අග්‍රාමාත්‍යතුමන්, ගරු අමාත්‍යවරුන් හා ගරු රාජ්‍ය අමාත්‍යවරුන් වෙනුවෙන් එවැනි ලිපි හෝ දුරකථන පණිවිඩ නිකුත් කළ හැක්කේ අග්‍රාමාත්‍ය ලේකම්, අමාත්‍යාංශ ලේකම්වරුන් හා රාජ්‍ය ලේකම්වරුන් පමණක් බවටද උපදෙස් දී ඇත. අදාල ලේකම්වරුන් විසින්, ගරු අග්‍රාමාත්‍යතුමන්, ගරු අමාත්‍යවරුන් හා ගරු රාජ්‍ය අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල මේ පිළිබඳ දැනුවත් කිරීමටත්, එවැනි කටයුතු මින් පෙර සිදු වී ඇත්නම් ඒවා නිවැරදි කරන ලෙසටත් නියෝග කරන ලෙසද මා වෙත උපදෙස් දී ඇත.

එබැවින්, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු අමාත්‍යවරුන් හා ගරු රාජ්‍ය අමාත්‍යවරුන්ගේ උපදෙස් මත වගකීමෙන් හා ගෞරවනීයත්වය ආරක්ෂා වන අයුරින් අදාළ පෞද්ගලික කාර්ය මණ්ඩල දැනුවත් කර අවශ්‍ය කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

පි. බී. ජයසුන්දර
ජනාධිපති ලේකම්

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01

දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873

ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657

ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk